# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**11 ශ්‍රේණිය** | **නැටුම් (දේශීය)** | **කාලය පැය 03**

**නම : ................................................................ පාසල :..........................................................................**

<u>සැලකිය යුතුයි</u>

- ❖ **සියලුම සිසුන් I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එයට අමතරව II කොටස උඩරට නර්තනය හෝ III කොටස පහතරට නර්තනය යන කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි. උඩරට නර්තනය හදාරන සිසුන් උඩරට II කොටස ද පහතරට නර්තනය හදාරන සිසුන් පහතරට III කොටස ද පිළිතුරු සැපයිය යුතුයි.**
- ❖ **II හා III කොටස් වලින් කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතුය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව ලියා දැක්විය යුතුය.**

## I කොටස

- අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන තෝරන්න.

1. ශාන්තිකර්මයක් පැවැත්වීමට සැලසුම් කිරීමේදී ප්‍රථමයෙන් ........................................... සිදු කෙරෙන්නේ මූලික චාරිත්‍ර විධියක් ලෙසිනි.

   (i) මල සිටුවීම (ii) තොට පේ කිරීම (iii) මඩු පේ කිරීම (iv) කප් සිටුවීම

2. රජ ඇමතිවරුන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා රචනා කරන ලද ගායනා විශේෂයක් ලෙස ............................................ හැඳින්විය හැකිය.

   (i) රබන් (ii) හටන් (iii) ප්‍රශස්ති (iv) ටීකා

3. පා සරඹ අභ්‍යාස කිරීමේදී යොදා ගන්නා සංණ වාද්‍ය භාණ්ඩය .................................................. නම් වේ.

   (i) ගැටබෙරය (ii) තාලම්පට (iii) පහතරට බෙරය (iv) පන්තේරුව

4. බලි ශාන්තිකර්මයේ එන ගායනා ....................................................... ලෙස හැඳින්වේ.

   (i) ග්‍රහපන්ති (ii) සෙත්කවි (iii) සැහැල්ල (iv) ආශිර්වාද කවි

5. අණබෙර නොන්චි යනුවෙන් හැඳින්වෙන්නේ ................................... නාටකයේ එන චරිත කිහිපයකි.

   (i) සොකරි (ii) කෝලම් (iii) යක් තොවිල් (iv) කංකාරී

6. ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්....'' මැයෙන් පෙරහැර පිළිබඳව ලියූ දේශාටන වාර්තාකරුවා වන්නේ .......................................... ය.

(i) ඉබන් බතූතා (ii) පාහියන් (iii) ස්පිල් බර්ජන් (iv) රොබට් නොක්ස්

7. උඩරට සහ සබරගමු යන සම්ප්‍රදායන් තුනෙහිම ................................ යන වචනය භාවිතා වේ.

(i) අඩව්ව (ii) මාත්‍රා පද (iii) කස්තිරම (iv) කලාසම

8. කවි ගායනා කරන විට හස්ත චලන පමණක් කරනු ලබන්නේ ......................................... නර්තන සම්ප්‍රදායේ වන්නම්වල ය.

(i) සබරගමු (ii) පහතරට (iii) භරත (iv) උඩරට


9. භරත මුණි විසින් ඉදිරිපත් කරන ලද රස අටට අමතරව නන්දිකේශ්වරයන් එක් කරන ලද රසය ................................. වේ.

(i) ශෘංගාර (ii) හාස්‍ය (iii) ශාන්ත (iv) කරුණා

10. තාල තැබීමේදී තාල ස්ථාන දැක්වීම ......................................... නම් වේ.

(i) අනඝාත (ii) ආඝාත (iii) විභාග (iv) මාත්‍රා

11. මෙම ඡායාරූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට හේතු පාදක වූ පුද්ගලයා වන්නේ,



(i) පණිභාරත මහතා (ii) චිත්‍රසේන ඩයස් මහතා

(iii) අච්චන් මහාරාජ් තුමා (iv) රබීන්ද්‍රනාත් තාගෝර් තුමාය

12. සිංහල ගැමි නැටුම් සඳහා භාවිතා කරන රංග උපකරණ වනුයේ,

(i) දැකැති, මෝල්ගස්, පතුරු ය. (ii) කළ, ලී, පන්තේරු ය.

(iii) කළ, රබන්, උඩැක්කි ය. (iv) වේවැල්, කඩු, පන්දු ය.

13. ලෝකවාසී ජනතාවට ශාන්තිය හා ආරක්ෂාව ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ප්‍රබන්ධිත භක්තියෙන් ගයන ලද ගී විශේෂයක් ලෙස දැක්විය හැකි වනුයේ,

(i) උඩරට වන්නම් ය. (ii) සබරගමු වන්නම් ය.

(iii) පහතරට සින්දු වන්නම් ය. (iv) ප්‍රශස්ති ය.

14. "උන් තැන අටයි - තරිකිට දොද් දොං තා......" යන පද කොටස අයත් ගායනය,

(i) ටීකා සී පද වේ. (ii) රබන් පද වේ.

(iii) බෙර පද වේ. (iv) ඔන්චිලි කවි වේ.

15. සිංහල නර්තන සම්ප්‍රදායන්ගෙන් බොහෝ විට දක්නට නොලැබෙන්නේ,

(i) ආංගික අභිනයයි (ii) වාචික අභිනයයි

(iii) ආහාර්ය අභිනයයි (iv) සාත්වික අභිනයයි

16. වාදනය කිරීමේදී හඬ නිපදවා ගැනීම සඳහා කඳ මැදින් අල්ලා ලිහිල් කිරීමෙන් හා තද කිරීමෙන් නාද හසුරුවන වාද්‍ය භාණ්ඩය,

(i) උඩැක්කිය යි. (ii) පන්තේරුව යි.

(iii) තම්මැට්ටම යි. (iv) දඬු බෙරය යි.

17. වීරත්වය දක්වෙන චලන ඇසුරින් නිර්මාණය කර ගන්නා ලද ගැමි නැටුමකි.

(i) පතුරු නැටුම (ii) ලී කෙළි නැටුම

(iii) කඩු නැටුම (iv) හටන් නැටුම

**ප්‍රශ්න අංක 18, 19 හා 20 සඳහා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරින් තොරන්න.**

| | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A පේළිය | ගණිතාලංකාර | ශෘංගාලංකාර | අභිනය දර්පන | නාට්‍ය ශාස්ත්‍රය |
| B පේළිය | උපුල්වන් දෙවියන් | දඹදෙණි යුගය | මහනුවර යුගය | සමනළ |
| C පේළිය | කදම්භ පක්ෂි | මුසලඩි | ශුද්ධ තාලය | සමන් දෙවියන් |

18. උඩරට වන්නම්හි ප්‍රභවය සිදු වූ යුගය හා අද්‍යතන යුගයේ නිර්මාණය වූ වන්නමක් දක්වෙන්නේ,

(i) B පේළියේ 2 හා C පේළියේ 3 තීරුවෙනි.

(ii) B හා C පේළිවල හා 2 තීරුවෙනි.

(iii) B පේළියේ 3 හා 4 තීරුවලිනි.

(iv) B පේළියේ 3 හා C පේළියේ 1 තීරුවෙනි.

19. පහතරට වන්නම් ප්‍රභවය සිදු වූ යුගය හා ඒ හා සම්බන්ධ දෙවියන් සඳහන් වන්නේ,

(i) B පේළියේ 2 හා 1 තීරුවලිනි.

(ii) B පේළියේ 3 හා 1 තීරුවලිනි.

(iii) B පේළියේ 2 තීරුවේ හා C පේළියේ 4 තීරුවෙනි.

(iv) B පේළියේ 3 තීරුවේ හා C පේළියේ 4 තීරුවෙනි.

20. රම්මොළවක අධිකාරම් රජුගේ ගුණ වර්ණනා කරමින් ලියූ පද්‍ය ග්‍රන්ථය දැක්වෙන්නේ,

(i) A පේළියේ 1 තීරුවෙනි.

(ii) A පේළියේ 2 තීරුවෙනි.

(iii) A පේළියේ 3 තීරුවෙනි.

(iv) A පේළියේ 4 තීරුවෙනි.

21. රෙදි පොට්ටනිය හා අත ඇති ලේන්සුව භාවිත කරමින් චලන අවස්ථා ඉස්මතු කරන චරිතය දක්නට ඇත්තේ,

(i) පහතරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයක් වන ජස ලෙන්චිනා කෝළමෙනි.

(ii) පහතරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයක් වන අණ බෙර නොන්චි කෝළමෙනි.

(iii) උඩරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයක් වන ජස ලෙන්චිනා කෝළමෙනි.

(iv) උඩරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයන් වන අණ බෙර නොන්චි කෝළමෙනි.

22. බෙර හඬ නාට්‍යයේ එන ''හනික වරෙව් කොල්ලනේ'' ගීතය ගායනා කරනු ලබන්නේ,

(i) බන්දුල ජයවර්ධන මහතා ප්‍රමුඛ කණ්ඩායම විසිනි.

(ii) රෝහණ බැද්දගේ මහතා ප්‍රමුඛ කණ්ඩායම විසිනි.

(iii) දයානන්ද ගුණවර්ධන මහතා ප්‍රමුඛ කණ්ඩායම විසිනි.

(iv) ජැක්සන් ඇන්තනී මහතා ප්‍රමුඛ කණ්ඩායම විසිනි.

- **ප්‍රශ්න අංක 23, 24 සඳහා පහත දැක්වෙන රූප ඇසුරින් පිළිතුරු සපයන්න.**



23. අනුපිළිවෙලින් මෙම රූපයන්ගෙන් දැක්වෙන ස්ථායී භාවයන් වන්නේ,

(i) භය, ශෝක හා උත්සාහ වේ.

(ii) උත්සාහ, භය හා ශෝක වේ.

(iii) ශෝක, භය හා උත්සාහ වේ.

(iv) භය, උත්සාහය හා ශෝක වේ.

24. මෙම ස්ථායීභාවයන්ගෙන් උපදින රස අනුපිළිවෙලින් දැක්වෙන්නේ,

(i) කරුණා, වීර හා භයානක යනුවෙනි.

(ii) වීර, භයානක හා කරුණා යනුවෙනි.

(iii) භයානක, වීර හා කරුණා යනුවෙනි.

(iv) කරුණා, භයානක හා වීර යනුවෙනි.

25. දක්ෂිණ භාරතයේ කේරළ ප්‍රාන්තයේ දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදාය වන්නේ,

(i) භරත නර්තන සම්ප්‍රදායයි. (ii) කථකලි නර්තන සම්ප්‍රදායයි.

(iii) කථක් නර්තන සම්ප්‍රදායයි. (iv) මණිපුරි නර්තන සම්ප්‍රදායයි.

26. කරදිය විශිෂ්ඨ නිර්මාණයක් වීම කෙරේ ආලෝකකරණය ඉවහල් වී ඇත. ඒ සඳහා දායකත්වය දැක්වූයේ,

(i) මහින්ද ඩයස් මහතාය. (ii) චිත්‍රසේන ඩයස් මහතාය.

(iii) ලයනල් අල්ගම මහතාය. (iv) මහගම සේකර මහතාය.

27. ක්‍රි.ව. 1526 සිට මෝගල් පාලනයත් සමග මුස්ලිම් ආභාෂය ලැබුණු ඉන්දියානු නර්තන සම්ප්‍රදාය වන්නේ,

(i) භරත නර්තන සම්ප්‍රදායයි. (ii) කථකලි නර්තන සම්ප්‍රදායයි.

(iii) කථක් නර්තන සම්ප්‍රදායයි. (iv) මණිපුරි නර්තන සම්ප්‍රදායයි.

28. ශ්‍රී ලංකාවේ නර්තන ඉතිහාසය සම්බන්ධයෙන් ඓතිහාසික මූලාශ්‍රය වශයෙන් සැළකෙන්නේ,

(i) ඉතිහාස ග්‍රන්ථ හා ජන කවි ය. (ii) ලෙන් ලිපි හා මහා කාව්‍ය ය.

(iii) දේශාටන වාර්තා හා ජනප්‍රවාද ය. (iv) වංශකතා හා සංදේශ කාව්‍ය ය.

29. පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංගයක එන සමූහ නර්තනාංගයක අලංකාරය වැඩි දියුණු කර ගැනීම සඳහා,

(i) ලය ප්‍රභේද අනුව නර්තනය සකස් කර ගැනීම අවශ්‍ය වේ.

(ii) ගැහැණු පිරිමි සමානව යොදා ගැනීම අවශ්‍ය වේ.

(iii) ගායන වාදන සමබර බවින් යොදා ගැනීම අවශ්‍ය වේ.

(iv) අවකාශය මැනවින් භාවිතා කිරීම අවශ්‍ය වේ.

30. සෞන්දර්ය විෂයයන්ගේ රස වින්දනය හා නිර්මාණ කුසලතා වැඩි දියුණු කර ගැනීමට,

(i) රූපවාහිනියේ දක්නට ලැබෙන විවිධ රටවල නර්තන, ගායන, වාදන නැරඹීම වැදගත් වේ.

(ii) පරිසරයේ දක්නට ලැබෙන නර්තන, සංගීත, චිත්‍ර සම්බන්ධ කලා කෘති අධ්‍යයනය කිරීම වැදගත් වේ

(iii) එළිමහන් වේදිකාවල පැවැත්වෙන නර්තන, ගායන, වාදන නැරඹීම ප්‍රයෝජනවත් වේ.

(iv) පුවත්පත්, සඟරා ආදියේ පළවන නර්තන, සංගීත, චිත්‍ර පිළිබඳ තොරතුරු කියවීම ප්‍රයෝජනවත්වේ.

## II කොටස (උඩරට නර්තනය)

31. උඩරට නර්තන සම්ප්‍රදායේ පමණක් භාවිතා කරන භාණ්ඩ වන්නේ,

(i) ගැටබෙරය, තාලම්පට, පනා බෙරය යි.

(ii) පොකුරු බෙරය, සෝෂක බෙරය, උඩැක්කිය යි.

(iii) ගැටබෙරය, උඩැක්කිය, පන්තේරුව යි.

(iv) තම්මැට්ටම, උඩැක්කිය, හොරණෑව යි.

32. ''වන පැත්ත බිය පත්ව සයනම්.....'' යන කවි පදය ගායනය කරන තාල රූපය වන්නේ,

(i) මාත්‍රා 2+3 ය.

(ii) මාත්‍රා 3+4 ය.

(iii) මාත්‍රා 2+4 ය.

(iv) මාත්‍රා 3+3 ය.

33. මාත්‍රා 2+4 තාල රූපයට අයත් අඩව්වක මුල් කොටස වනුයේ,

(i) ජෙන් තත් /// ජෙන්තා ය.

(ii) කුඳ ගජිගත/// කුඳ තා ය.

(iii) කුඳ ගජිත/// කුඳ තා ය.

(iv) තාකු තක්කුං තරිකිට තකුඳ තත් ජෙං ය.

34. ප්‍රවීන උඩරට නර්තන ශිල්පියෙකි.

(i) කේ. එස් ප්‍රනාන්දු මහතා

(ii) ජී. වී. හීන්නිලමේ මහතා

(iii) එස්. එල්. එච්. ප්‍රනාන්දු මහතා ය.

(iv) අර්නෝලිස් ඉඹුලේගොඩ මහතා

35. සොකරි නාටකය රඟ දක්වා ඇත්තේ,

(i) සශ්‍රීකත්වය පදනම් කරගත් පූජා කර්මයක් වශයෙනි.

(ii) බෝවන රෝග නිවාරණය කරන ශාන්ති කර්මයක් වශයෙනි.

(iii) සමාජ දුර්වලතා විවරණය කරන හාස්‍ය ජනක නාට්‍යයක් වශයෙනි.

(iv) විදේශිකයින්ගේ පැමිණීම සම්බන්ධ වූ පූජා කර්මයක් වශයෙනි.

36. රම්මොළවක අධිකාරම්තුමා විසින් වන්නම් ප්‍රබන්ධකොට ගම්වර ලබාගත් බව දක්වෙන ජේ. ඊ. සේදරමන් මහතාගේ කෘතිය වන්නේ,

(i) සද්ධර්ම රත්නාවලියයි.

(ii) දහඅට වන්නම් කෘතියයි.

(iii) උඩරට නැටුම් කලාවයි.

(iv) නෘත්‍යරත්නාකරයයි

37. ''දොම්තකු දොම්තකු දොංජිං - ගත් තත් ජිං තරිකිට'' මෙය

(i) මාත්‍රා 4+4 තාල රූපයට අයත් බෙර පදයකි.

(ii) මාත්‍රා 2+2+3 තාල රූපයට අයත් බෙර පදයකි.

(iii) මාත්‍රා 2+2+4 තාල රූපයට අයත් බෙර පදයකි.

(iv) මාත්‍රා 2+2 තාල රූපයට අයත් බෙර පදයකි.

38. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ හිසට පළඳින ආභරණ වන්නේ,


(i) උල් උඩය, නිසන් සඟල හා ජටාව වේ.

(ii) ජටාව, කයිමෙත්ත හා ජටා පටිය වේ.

(iii) ශිඛා බන්ධනය, නෙත්තිමාලය හා පායින්පත වේ.

(iv) ජටාව, උරමාලය හා උරබාහු වේ.

- පහත දැක්වෙන රූපය ඇසුරෙන් ප්‍රශ්න අංක 39 හා 40 පිළිතුරු සපයන්න.




39. මෙම රූපයේ 1,2,3 යනුවෙන් දැක්වෙන්නේ,

(i) බෙර පුහුල, කැපුම් හම හා කන්වරයයි.

(ii) කන්වරය, කැපුම් හම හා වෙනිවර කැරැල්ලයි.

(iii) කයිපුඩි වලල්ල, වෙනිවර කැරැල්ල හා කැපුම් හමයි.

(iv) බෙර ලණුව, බෙර පුහුල හා වෙනිවර කැරැල්ලයි

40. මෙම බෙරයෙන් උපදින බීජාක්ෂර සතර වන්නේ,

(i) තත් ජිත් තොං නං වේ.

(ii) තත් දිත් තොං නං වේ.

(iii) තත් ජිත් තක ජිත් වේ.

(iv) කුඳ ගත ගත දොං වේ.

## II කොටස (පහතරට නර්තනය)

31. පහතරට නර්තනයේදී පමණක් භාවිතා කරන භාණ්ඩ හා මෙවලම් වන්නේ,

(i) රුහුණු බෙරය, විලක්කු, තම්මැට්ටම

(ii) දික් බෙරය, පන්දම්, වෙස් මුහුණු

(iii) පහතරට බෙරය, දෙවොල් තොප්පිය, උණුනු පියන

(iv) පහතරට බෙරය, බන්දි වළලු, හොරණෑව

32. ''සිරි පිරි ගිරි මුදුනත සුරපුර ලෙසිනා....'' යන කවි පදය ගායනා කරන තාල රූපය වන්නේ,

(i) මාත්‍රා 2+3 තාල රූපයට ය. (ii) මාත්‍රා 2+2+3 තාල රූපයට ය.

(iii) මාත්‍රා 3+4 තාල රූපයට ය. (iv) මාත්‍රා 2+2+4 තාල රූපයට ය.

33. මාත්‍රා 2+4 තාල රූපයට අයත් ඉරට්ටියක මුල් කොටස වනුයේ,

(i) දොම් තත් දිමි ගත ගුගුදිත ය.

(ii) ජිංත ගත් ගතත් ගතිත ගත දොං ය.

(iii) තක දිත් තක දොං කිත්තත් කිටිතක ය.

(iv) තත් ගුද ගත දිත් දිත් තෙයි ය.

34. ප්‍රවීන පහතරට නර්තන ශිල්පියෙකි,

(i) ජී. වී. හීන්නිලමේ මහතා (ii) එස්. පණීභාරත මහතා

(iii) චිත්‍රසේන ඩයස් මහතා (iv) විල්සන් ඔලබොඩුව මහතා

35. කෝළම් නාටක රඟ දැක්වීම තුලින් විද්‍යාමාන වන්නේ,

(i) එවකට පැවති සමාජ විවරණය සහ ශාන්තිය අපේක්ෂා කිරීමය.

(ii) එවක සමාජයේ හුදු විනෝදාස්වාදය සඳහා

(iii) බෝවන රෝග නිවාරණය හා ශාන්තිය සඳහා

(iv) උසස් සමාජ කණ්ඩායම් විවරණය සඳහා

36. උපුල්වන් දෙවියන්ට පූජෝපහාර ලෙස සින්දු වන්නම් රචනා කළා යයි දැක්වෙන සී. ද. එස්. කුලතිලක මහතාගේ කෘතිය වන්නේ,

(i) සද්ධර්මරත්නාවලිය යි. (ii) පහත රට නැටුම් කලාව යි.

(iii) නෘත්‍ය රත්නාකරය යි. (iv) දහ අට වන්නම් කෘතිය යි.

37. ''දිත් තම් දිතම් දොං දොංතා....'' මෙය

(i) මාත්‍රා 4+4 තාල රූපයට අයත් බෙර පදයකි.

(ii) මාත්‍රා 2+2+3 තාල රූපයට අයත් බෙර පදයකි.

(iii) මාත්‍රා 2+2+4 තාල රූපයට අයත් බෙර පදයකි.

(iv) මාත්‍රා 2+2 තාල රූපයට අයත් බෙර පදයකි.

38. පහතරට දෙවොල් මඩුවේ එන තෙල්මෙ ඇඳුම් කට්ටලයේ කොටස් කිහිපයක් නම්,


(i) සිලම්බු, බුබුළු පටිය, ඉනරුල්ල ය.

(ii) අත්පොට, පච්ච වඩම, උල්උඩය වේ.

(iii) පබළු හැට්ටය, කරමාලය, පච්ච වඩම වේ.

(iv) බන්දි වළලු, ශිඛා බන්ධනය, කකුල් පටිය වේ.

- පහත දැක්වෙන රූපය ඇසුරින් ප්‍රශ්න අංක 39,40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




39. මෙම රූපයේ 1,2,3 යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) බෙර ඇස, කන්වරය, බෙර කඳ ය.

(ii) වරපටි, වෙනිවර, හැක්ම ය.

(iii) වෙනිවර, හැක්ම, බෙර කඳ ය.

(iv) හැක්ම, බෙර කඳ, වරපටි ය.

40. මෙම බෙරයෙන් උපදින බීජාක්ෂර සතර වන්නේ,

(i) තත් දිත් තොං නං වේ.

(ii) තත් ජිත් තොං නං වේ.

(iii) ගදි කිට ගත දොං වේ.

(iv) ගුං දිත් ගුං දෑහිං වේ.

# නැටුම් (දේශීය) II

- **පළමු වැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. රබීන්ද්‍රනාත් තාගෝර්තුමා ලංකාවට පැමිණියේ .......................... වසරේදී ය.

ii. 1959 ඊ. ඒ. දෙල්ගොඩ මහතා විසින් සබරගමු වන්නම් පිළිබඳ රචිත ග්‍රන්ථය ............................ යි.

iii. 'රණේ රුවසේ වත රුවින් දිලේ දෝ'' මෙය ............................... කවියකි.

iv. වර්ණ හා හැඩතල උපයෝගී කර ගනිමින් කෙනෙකුගේ බාහිර පෙනුම චරිතයට උචිත පරිදි යොදා ගැනීම ............................. යි.

v. බලි ඇඳුරා බෙර වාදනයට අනුව දකුණු අතට ........................... ගෙන සරල නර්තනයක යෙදේ.

vi. ''අඩවන් වූ දෙනෙතින් ගලනා - මෙත් මුදිතා කරුණා ධාරා'' යන ගීතය ශ්‍රවණය කිරීමෙන් .......................................... භාවය ඇතිවේ.

vii. ........................... මහත්මිය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යක්ෂ ධූරය දැරුවාය.

viii. යක්ඇනුම ගායනය .................................. නර්තන අංගයකි.

ix. 'ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ'' යන කවිය අයත් ගැමි නාටකය හා එයින් හැඳින්වෙන චරිතය නම් කරන්න.

(අ) ..................................................

(ආ) ................................................

x. ග්‍රහ අපලය හා පරෙවිය යන මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කළ ශිල්පීන් දෙදෙනා නම් කරන්න.

(අ) ..................................................

(ආ) ................................................

(ලකුණු 12)

02. නියමිත මූලධර්ම අනුගමනය කරමින් ප්‍රස්තාර කරන්න.

i. මාත්‍රා 3+4 තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 04)

ii. ''ගාන තෙල් සඳුන් වරලස....'' යන පන්තෙලීමේ කවියේ කවි පද දෙකක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 04)

iii. සැවුලා වන්නමට හෝ නාතිලිංචි තාලය සින්දු වන්නමට අයත් අඩව්වක් / ඉරට්ටියක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 04)

03. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. වජිරා චිත්‍රසේන මහත්මිය

ii. සතර අභිනය

iii. පංච තූර්ය වාද්‍ය භාණ්ඩ

iv. සරල අංග රචනය

v. ප්‍රශස්ති (ලකුණු 4×3=12)

04. ශාන්තිකර්මවලින් බැහැර වූ නර්තන අංගයක් ලෙස වන්නම් හැඳින්විය හැකිය.

i. වන්නම්වල පොදු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ඔබ ඉගෙන ගත් නර්තන සම්ප්‍රදායට අනුව එහි ඓතිහාසික තොරතුරු සඳහන් කරන්න. (ලකුණු 04)

iii. සම්ප්‍රදායන් දෙකක වන්නම්වල ඇති ලක්ෂණ පහත කරුණු යටතේ සාකච්ඡා කරන්න.

(අ) නාමික වශයෙන් ඇති සමාන අසමානතා

(ආ) වන්නම්වල ව්‍යුහයේ ඇති සමාන අසමානතා (ලකුණු 06)

05. පහත රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



i. A හා B රූපවල දක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කර පවලිත ප්‍රදේශ දෙකක් ලියන්න. (ලකුණු 04)

ii. එම සම්ප්‍රදායන්ට අයත් සංගීත සම්ප්‍රදායන් දෙක විස්තර කරන්න. (ලකුණු 04)

iii. ඉහත සඳහන් එක් නර්තන සම්ප්‍රදායක රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 04)

06. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන්ම ඔවුන් තුල පවතින විශ්වාස ගැමි කවිවලින් ගම්‍ය වේ.

i. ශ්‍රී ලංකාවේ වෘත්තීන් හා සම්බන්ධව ගොඩනැගුණු ගැමි නැටුම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. ඉන් කවර හෝ ගැමි නැටුම් දෙකක කවියක් බැගින් ලියන්න. (ලකුණු 04)

iii. එම කවිවලින් කියැවෙන ගැමි ජනතාවගේ ජීවන රටාව පිළිබඳ තොරතුරු විස්තර කරන්න. (ලකුණු 05)

07.

i. නර්තන කලාවේ ඇති වූ නව ප්‍රබෝධය නිසා සිදු වූ ප්‍රවණතා 4 ක් ලියන්න. (ලකුණු 04)

ii. 70 දශකයේ අධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ සිදු වූ වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ කරුණු පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 04)